# නිතර පැන නැගෙන ගැටළු: (FAQS)

# CCM යාන්ත්‍රණයට සම්බන්ධ වීම (ENGAGING THE CCM)

දැනට පවතින ගෝලීය අරමුදල් ආකෘතිය යටතේ, ආධාර සඳහා ගෝලීය අරමුදල වෙත ඉල්ලුම්පත් යැවීමත්, ආධාර ලබා ගැනීමත් මූලිකවම සිදුකරනු ලබන්නේ CCM යාන්ත්‍රණ මගිනි. කෙසේ වෙතත් මෙම අරමුදල් ආකෘතිය රටක් නියෝජනය කරමින් විවිධ ප්‍රජා හා අධි අවධානම් කලාපයේ පුද්ගලයින් හට තම සහභාගීත්වය සැපයීම සඳහාද ඉඩ ප්‍රස්ථාව ඇතිකරනු ලබන බව පෙනී යයි. එමෙන්ම, මෙම ආධාර සඳහා යොමුකරනු ලබන අයදුම් හඳුනා ගත් ප්‍රධාන රෝග 3 මර්ධනය පිලිබඳ කල සැලසුම් හා වැඩපිලිවෙලටද සමපාත විය යුතුය.

විවිධ ප්‍රජා හා අධි අවධානම් කලාපයේ පුද්ගලයින් අරමුදල ඔස්සේ ආධාර ලබා ගැනීමේ රාමුව තුල මෙම ක්‍රියාවලිය හා නිරතව සිටින බවත්, විශාල රටවල මේ හා සම්බන්ධ සැලසුම් (හඳුනා ගත් ප්‍රධාන රෝග 3 හා බැඳි ජාතික ක්‍රමෝපායන් සැලැස්මේ අන්තර්ගතය හා වැඩිදියුණුව පිලිබඳව වැනි) පිලිබඳවත් CCM යාන්ත්‍රණ මගින් තහවුරු කල යුතුවේ.විවිධ රටවල් HIV, ක්ෂය රෝගය හා මැලේරියා මර්ධනය පිලිබඳ ක්‍රමෝපායන් ප්‍රතිසංස්කරණය කරමින් පවතින අතර, මෙහිදී CCM යාන්ත්‍රණ නියෝජිත ප්‍රජාවන්ගේ සහභාගීත්වය අතිශය වැදගත් වී තිබේ. තවද, ගෝලීය අරමුදලේ 2017-2022 සඳහා වූ නව ක්‍රමෝපායන්, තිරසාර බව උදෙසා සම්පාදනය වූ පිලිවෙත්, සංක්‍රමණ හා සම-මූල්‍යකරණ ප්‍රතිපත්ති හමුවේ CCM ඔස්සේ ප්‍රජා සහභාගීත්වය සඳහා වැඩි ඉඩකඩක් ඇතිවීමත්, මෙම රෝග 3 හා බැඳි අධි අවධානම් කලාප සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීමට අවශ්‍ය සම්පත් සොයා ගැනීමටත් හැකිවන බව පෙනී යයි.

මෙවන් රෝග නිවාරණය පිලිබඳ ජාතික ප්‍රතිපත්තියක් තුලින් ප්‍රජා අයිතිවාසිකම් හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳි මතභේද ප්‍රතිසංස්කරණය වීමකටද ඉඩකඩ සපයා දේ.

## CCM යනු කුමක්ද? (What is the CCM?)

CCM යාන්ත්‍රණය යනු ගෝලීය අරමුදලේ රට මට්ටමින් පවත්වාගෙන යනු ලබන, එම රටෙහි රජය හා අනුබද්ධිත, අදාල අරමුණ කරා ලඟා වීමට හා සංවර්ධනයට අවශ්‍ය මූල්‍යමය ආධාර සඳහා අයදුම් කරන ආයතනයකි. මෙම භූමිකාවට අමතරව, මෙම ආධාර මත නව වැඩසටහන් දියත් කිරීමත්, අනෙකුත් ජාතික සෞඛ්‍ය හා සංවර්ධන වැඩසටහන් හා සම්බන්ධ වෙමින් සම්බන්ධීකාරකයෙක් ලෙස ක්‍රියා කිරීමත් සඳහා අදාල රටෙහි PR ශාඛාව යෝජනා කිරීමද CCM යාන්ත්‍රණයේ අනිවාර්‍ය කාර්‍යභාරයකි.

රෝග විනිශ්චය හා බැඳි කොටස්කරුවන් ගේ නියෝජිතයින් ගෙන් CCM යාන්ත්‍රණය නිර්මාණය වී ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශය හා රෝග නිවාරණ වැඩසටහන්, පෞද්ගලික අංශය, සිවිල් සංවිධාන, ආසාධිත හෝ අවධානමට ලක්වූ ප්‍රජා, අධ්‍යාපනික ආයතන, හා අන්තර්ජාතික හෝ බහුපාර්ශවීය සංවර්ධනය කෙරේ දායක වන ආයතන මේ සඳහා උදාහරණ වේ.

CCM යාන්ත්‍රණයේ ඵලදායිතාව ස්වයංසිද්ධවම කලමනාකරණය කරගැනීමේ හැකියාව ඔවුන් සතුව පවතී. එමෙන්ම ඔවුන්ගේ සභාපතිත්වය හා උප-සභාපතිත්වය පිහිටුවා ගැනීමේ ස්වාධීන අයිතිය ඔවුන් සතු වේ. මේ සඳහා විවිධ අංශයන්ගේ සහභාගීත්වය පැවතිය හැක. වඩාත් විධිමත් තීරණ ගැනීමේ පරිසරයක් ඇතිකරලීමේ අරමුණින් ඔවුන් මේ තුල විධායක හා තාක්ෂණික කමිටු හා සක්‍රිය කණ්ඩායම් පත් කර ගනු ලබන අතර, මෙම කමිටු තුල රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික හා සංවර්ධන අංශයන්ගේ නියෝජනයක් පවත්වා ගැනීමටත් ඔවුහු අපේක්ෂා කරති.

ගෝලීය අරමුදල මගින් දැනට පවතින අරමුදල් ආකෘතිය ඔස්සේ ජාතික වශයෙන් CCM යාන්ත්‍රණය තුල වඩාත් සවිමත් නායකත්වයක් ඇති කරනු ලැබ ඇති අතර, අරමුදල් අයදුම් සංවර්ධනය කිරීමේ පහසුව සඳහා බහු-භාෂාමය සංවාද ඇතිකරලීමටත්, එමගින් ජාතික ක්‍රමෝපායන් සැලැස්ම තුල CCM යාන්ත්‍රණයට වඩාත් සක්‍රිය දායකත්වයක් පෙන්වීමටත් එය මග පාදනු ලබයි. තවද, මෙමගින් රෝග මර්ධනයට අවශ්‍ය මූල්‍යාධාර ප්‍රදානය කඩිනමින් සිදුවීමත්, එය සාධාරණව බෙදී යාමත් සිදුවනු ඇත.

## CSO, ප්‍රජා කණ්ඩායම් හා අධි අවධානම් ප්‍රජාවන් CCM හා සම්බන්ධ විය යුත්තේ ඇයි? (Why should CSOs, community groups and key populations engage the CCM?)

ඇතැම් විට ජාතික ප්‍රතිපත්ති මගින් සිවිල් සංවිධාන, ප්‍රජා සාමාජිකයින් හා අධි අවදානම් කලාප වල පුද්ගලයින්ගේ සහභාගී වීම් වලට සීමාමායිම් පැනවීම ගැටළුවකි. එවන් අවස්ථා වල ගෝලීය අරමුදලේ මග පෙන්වීම යටතේ CCM යාන්ත්‍රණය මෙම ප්‍රජා සාමාජිකයින් හා අධි අවදානම් කලාප වල පුද්ගලයින් හට සහභාගී වීමට අවස්ථා සලසා දෙනු ලබයි.

**CCM යාන්ත්‍රණයට සම්බන්ධ වීම මගින් ඔබට:**

- HIV, ක්ෂය රෝගය, හා/හෝ මැලේරියා සම්බන්ධව ජාතික ක්‍රමෝපායන් වල ප්‍රවර්ධනයක් ඇතිකරලීමට අවස්ථා උදා කර ගත හැක;
- ජාතික වැඩසටහන් දියත් කිරීමේදී සැලකිලිමත් වීමටත්, වෙනත් කොටස්කරුවන් ගේ දායකත්වයේදී කායීක්ෂම අයුරින් ක්‍රියා කිරීමටත්, විශේෂයෙන්ම හඳුනා ගත් ප්‍රධාන රෝග 3 මර්ධනය උදෙසා වූ මූල්‍යමය ආධාර අධි අවදානම් කලාප වල පුද්ගලයින් වෙත නිසි පරිදි ලබා දීමටත් CCM වෙත නව අදහස් ලබා දිය හැක.
- ගොලීය අරමුදල පාදක කරගත් වෙනත් වැඩසටහන් වල ක්‍රියාත්මක වන යාන්ත්‍රණ වැඩිදියුණු කිරීමට දායකත්වය ලබා දීමටත්; හා
- HIV, ක්ෂය රෝගය, හා මැලේරියා සම්බන්ධ වැඩසටහන් (සෘජුවම හෝ අර්ධ වශයෙන් ගෝලීය අරමුදලේ ආධාර නොලබන වැඩසටහන්ද ඇතුලුව) වැඩිදියුණු කිරීමට, සමාලෝචනය කිරීමට හෝ සංවර්ධනය කිරීමට නව කොටස්කරුවන් සහභාගී කරවා ගත හැක.

## අපගේ ප්‍රජා සංවිධානය මෙම CCM යාන්ත්‍රණය හා සම්බන්ධ වීමට කැමති මුත්, අපගේ CCM යාන්ත්‍රණය ප්‍රජා කණ්ඩායම් සමග ක්‍රියා කිරීමට කැමත්තෙන් පසුවන බවට සහතිකයක් දිය හැකිද?
## (Our community organisation is eager to take part in CCM processes, but is there any guarantee that our CCM will be open to engage with community groups?)

සිවිල් සංවිධාන, ප්‍රජා-පාදක සංවිධාන, සහ අධි අවදානම් කලාප ජාලයන්ගේ වඩාත් පුළුල් දායකත්වයක් ඇති කරන ලද ප්‍රතිසංස්කරණ දැනට පවතින අරමුදල් ආකෘතියෙන් හඳුන්වා දී ඇත. ගෝලීය අරමුදලේ මූල්‍යමය ප්‍රතිපාදන වෙත පිවිසීමට නම්, CCM බහුවිධ කොටස්කරුවන්ගේ සහභාගීත්වය හා දායකත්වය අනිවාර්යයෙන්ම ලබා ගත යුතුවේ. මේ අනුකූලව ගෝලීය අරමුදල මගින් වාර්ශිකව සෑම අයදුමක් සමගම පහත සඳහන් අවශ්‍යතා නිරීක්ෂණය කරනු ලබයි.

- අවශ්‍යතාව 1 - ආධාර අයදුම් සඳහා යෝජිත ක්‍රියාකාරකම් සංවර්ධනය හා සමාලෝචනය කිරීම තුලදී, ඉතා පුළුල්, ලිඛිත හා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියක් සිදුවිය යුතු අතර, මේ සඳහා බහුවිධ කොටස්කරුවන්ගේ (CCM සාමාජිකයින්ගේ සිට CCM නොවන සාමාජිකයින් දක්වා, විශේෂයෙන්ම අධි අවදානම් කලාපයේ පුද්ගලයින්) සහභාගීත්වයද පැවතිය යුතුය.
- අවශ්‍යතාව 2 - ආධාර අයදුම් සඳහා අදාල PR තෝරා ගැනීමේදී විවෘත හා විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියක් සිදුවිය යුතුය.
- අවශ්‍යතාව 3 - අනුමැතිය ලද ආධාර හා බැඳී අධීක්ෂණය සඳහා වූ බහුවිධ කොටස්කරුවන්ගේ (CCM සාමාජිකයින්, CCM නොවන සාමාජිකයින්, ඒ ඒ අදාල සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා අධි අවදානම් කලාපයේ පුද්ගලයින්) සහභාගීත්වය පිලිබඳ විස්තර ඇතුලත් කරන ලද සැලසුම් වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.
- අවශ්‍යතාව 4 - CCM යාන්ත්‍රණය තුල HIV, ක්ෂය රෝගය, හා/හෝ මැලේරියා සමග ජීවත් වන්නන් සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්නන්, මානව හිමිකම්, ස්ත්‍රී-පුරුශ භාවය හා එම රෝග වල වසංගත තත්ව හමුවේ අධි අවදානම් කලාපයේ ජීවත් වන පුද්ගලයින් සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්නන් ගේ සාමාජිකත්වය ඇති බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.
- අවශ්‍යතාව 5 - CCM තුල සාමාජිකත්වය දරන රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය තෝරා පත් කර ගනු ලැබුවේ එම සංවිධාන තුලම සිදුවූ ලිඛිත හා විනිවිධභාවයකින් යුත් ක්‍රියාදාමයක් තුල බව අවධාරණය කල යුතුය. අවම වශයෙන් CCM සාමාජිකයින් ගෙන් 40% ක නියෝජනයක් වත් රාජ්‍ය නොවන සංවිධාන වෙත පැවරී තිබිය යුතුයි.

- අවශ්‍යතාව 6 - ඇතැම් විට පැන නැගීමට ඉඩ ඇති අර්බුද නිරාකරණය කිරීම පිලිබඳ නිශ්චිත හා ලිඛිත යාන්ත්‍රණයක් පැවතිය යුතු අතර, මෙහිදී CCM සාමාජිකයින් හට මෙම අර්බුද බලපාන්නේ නම් ඒ පිලිබඳවද අනිවාර්යයෙන් සඳහන් කල යුතුය. මෙම අර්බුද පැන නගින අවස්ථාවන් හීදී ඒ සඳහා විසඳුම් ගැනීම සඳහා CCM සාමාජිකයින් හට සහභාගී වීමට අවසර නැත.

මෙම අවශ්‍යතා CCM යාන්ත්‍රණය තම අනිවාර්ය කාර්‍යභාරය මැනවින් ඉටුකරනා බව තහවුරු කිරීමට ගනු ලබන මිනුම් දණ්ඩක් හැටියටද සැලකිය හැක. උදාහරණයන් වශයෙන්, පිරිමින් හා කාන්තාවන් ගේ සම නියෝජනය CCM යාන්ත්‍රණය තුල පැවතිය යුතුයි. තවද, ඉල්ලුම් ඇතුලත් කිරීමේදී හා ඒ පිලිබඳ ප්‍රතිචාර දැක්වීමේදී ඒ සඳහා පැහැදිලි යාන්ත්‍රණයක් මේ තුල පැවතිය යුතුයි. එමෙන්ම CCMහි නායකත්වය (සභාපති හා උප-සභාපති ධුර) තුල බහුවිධ කොටස්කරුවන්ගේ නියෝජනයද පැවතිය යුතුයි.

මෙමගින් අදහස් වන්නේ ඉහත යටත් පිරිසෙහි අවශ්‍යතා සැපිරීමට ආපොහොසත් වන්නේ නම් මූල්‍ය සම්පාදනය සඳහා CCM යාන්ත්‍රණය නුසුදුසු වන බවයි.

## ගෝලීය අරමුදල මෙම අවශ්‍යතා වලට අනුකූලව කටයුතු සිදුවන්නේ දැයි අධීක්ෂණය කරන්නේ කෙසේද? (How does the Global Fund monitor compliance to these requirements?)

CCM යාන්ත්‍රණය මෙම අවශ්‍යතා සපුරන්නේ දැයි හා ඔවුන් විසින් මූල්‍ය අයදුම් සිදුකරන සෑම අවස්ථාවකදීම අධීක්ෂණය උදෙසා, කාර්‍යසාධනය හා සුදුසුකම් සඳහා වූ පරීක්ෂණයක් (EPA) ගෝලීය අරමුදල මගින් වාර්ශිකව දියත් කරනු ලබයි. මූල්‍ය අයදුම් යොමුකිරීමේදී, CCM යාන්ත්‍රණය විසින් අව්‍යශතා 1 හා 2 සපුරා ඇත්දැයි දැඩිව බලන අතර, EPA පරීක්ෂණයේ ප්‍රතිඵල වලට අනුව හා රටක් වශයෙන් අනුගමනය කරන ප්‍රතිපාදන වලටද අනුකූලව, මෙම ක්‍රමවේදයට පරිභාහිර ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ගෝලීය අරමුදල උත්සුක වෙයි.

සමාලෝචනය කිරීමේදී පහත සඳහන් ප්‍රවේශයන් 2 අනුගමනය කරන්නේ අවශ්‍යතා සපුරන ලද බව ලිඛිත සාක්ෂි මත පෙන්වීම සඳහා පමණක් බව සලකන්න.

- සම්මත ප්‍රවේශය (Standard Approach) - මෙය අනුකූලතාවට සහාය වීම සඳහා සම්මත සුදුසුකම් පිළිබඳ විස්තර සහ ලේඛන ඉදිරිපත් කිරීමට අදාල වේ.
- සැහැල්ලු ප්‍රවේශය (හෝ ඉතා සැහැල්ලු ප්‍රවේශය) (Light/or Super Light Approach) - CCM යාන්ත්‍රණය ඔවුන්ගේ අනුකූලතාව ප්‍රකාශයට පත් කල ලේඛනයක් ඉදිරිපත් කල යුතුයි.

අවශ්‍යතාව 1හිදී, වැඩසටහන අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් හට සැහැල්ලු වශයෙන් සමාලෝචනයක් සිදුකරනු ලබන අතර, අවශ්‍යතාව 2 සඳහා හොඳින් ක්‍රියාකාරී PR ආයතන වෙත සැහැල්ලු ප්‍රවේශය අනුගමනය කරනු ලබයි. නව රෝග සංරචකයක් වෙනුවෙන් ක්‍රියාකාරී PR ආයතන හෝ අලුතින් සම්පාදනය කර ගත් PR ආයතන වෙත සම්මත ප්‍රවේශය අනුගමනය කරනු ලබයි.

## සිවිල් සංවිධාන කණ්ඩායම්, ප්‍රජා සංවිධාන, අධි අවදානම් කලාප ජාල හට මේ සඳහා සහභාගී වීමට හැක්කේ කුමන පියවරෙහිද?

## (At which stage can civil society groups, community organization, key population networks engage?)

දැනට පවතින අරමුදල් ආකෘතියට අනුව සිවිල් සංවිධාන කණ්ඩායම්, ප්‍රජා සංවිධාන, හා අධි අවදානම් කලාප ජාල හට සක්‍රියව දායක වීමේ යාන්ත්‍රණයන් බොහොමයක් හඳුන්වා දී ඇත. මෙහිදී ඔබ CCM ආයතනයේ ලේඛකාධිකාරී හරහා ඔබ ආයතනය හඳුන්වා දීමටත්, CCM යාන්ත්‍රණය සඳහා ඔබගේ ඇති උනන්දුව සන්නිවේදනය කිරීමත් අත්‍යාවශ්‍යයයි.

**පහත දැක්වෙන්නේ මේ සඳහා ඔබගේ ඍජු සහභාගීත්වය විවර කර ගැනීම සඳහා සැකසුන යාන්ත්‍රණ වේ:**

- රට තුල අරමුදල් අයදුම් කිරීම වර්ධනය කිරීම සඳහා සංවිධානය කළ යුතු සංවාදයන්හීදී;
- ජාතික ක්‍රමෝපායන් සැලසුම් කිරීම හෝ සමාලෝචනය කිරීම සඳහා රට තුල පවතින වැඩසටහන් මගින් ක්‍රියාත්මක කරන ප්‍රජා උපදේශන සේවාවන්හීදී;
- රටතුල සංචාරය සඳහා දේශීය කණ්ඩායාම පැමිණීමේදී ඔබට රැස්වීමක් සඳහා ඉල්ලීමක් කළ හැකිදැයි සොයා බැලීමට ඔබේ අරමුදල් සම්බන්ධ කලමනාකරු වෙත පිවිසිය හැකිය;
- අරමුදල් අයදුම් කිරීමේ පටිපාටිය නිර්මාණය වෙමින් පවතින අතරතුරදී, ප්‍රජාව වෙනුවෙන් සිදුවන ක්‍රියාකරකම් වෙත මැදිහත් වන බව ඔප්පු කල හැකි සාක්ෂි ඔබට ඉදිරිපත් කල හැකිය;
- රාජ්‍ය නොවන කොට්ඨාශයක් නියෝජනය කරන සාමාජිකයෙකු වීම සඳහා ඔබගේ ඇති උනන්දුව CCM වෙත දැනුම් දිය හැකිය;

ඔබට CCM රැස්වීම් වලට සහභාගී විය හැකි අතර එහිදී ඔබ නියෝජනය කරන අධි අවධානම් කලාප හෝ රෝග සමග ජීවත් වන පුද්ගලයින් වෙනුවෙන් මැදිහත් වීමක් සිදුකරන ලෙස ඉල්ලා සිටිය හැක. එමෙන්ම, CCM තුල දැනටමත් සේවය කරන ඔබගේ ප්‍රජාවේ සාමාජිකයින් හා ඔවුනට සහයෝගය දක්වන්නන් වෙත පිවිස මේ පිලිබඳ CCM ඇතුලත හඬක් නැගීමට ඉඩ ප්‍රස්ථාව සකසා ගැනීමටද ඔබට පුළුවන.

## අපගේ CCM ලේකම් කාර්යාලය අප ආයතනය හට මේ සඳහා සහභාගී වීමට නොහැකි බව පවසයි, කල යුත්තේ කුමක්ද? (Our CCM Secretariat says that my organization can't engage. What should I do?)

CCM හි කාර්යසාධනය සාමාන්‍යයෙන් ඇගයීමට ලක් කරනු ලබන්නේ ගෝලීය අරමුදලේ ලේඛකාධිකාරී විසිනි. මෙය සිදුකරනු ලබන්නේ සැපිරිය යුතු සුදුසුකම් හා අවම සම්මතයන් වලට අනුකූලව CCM පවතින්නේ දැයි පරීක්ෂා කිරීමටයි.

මේ පිලිබඳව ඔබගේ CCM ලේඛකාධිකාරී දැනුවත් කර තිබීමද අනිවාර්යය වේ. අධි අවධානම් කලාප නිසි පරිදි උපදේශනයට ලක් කිරීම සඳහා CCM යාන්ත්‍රණය සැමවිටම පෙර-සූදානමින් ක්‍රියාත්මක විය යුතුය. තවද, ප්‍රජාවන් හා අධි අවධානම් කලාප සඳහා උපදේශන සේවා පැවැත්වීම මේ සඳහා සහභාගී වීමට ලබන සුදුසුකමක් බව ඔවුන් දැනුවත් කල යුතුය. මේ අතරම, ඔබට ඔබේම ප්‍රජාවන් සඳහා උපදේශන කටයුතු ඍජුවම කරගෙන යා හැකි අතර එහි ප්‍රතිඵල සහ ලේඛන CCM වෙත ඉදිරිපත් කළ යුතුය.

තවදුරටත් පවසන්නේ නම්, මෙම අවශ්‍යතා හා අවම ප්‍රමිතීන් සපුරා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ගෝලීය අරමුදල විසින් මාර්ගෝපදේශ ලබා දී තිබෙන අතර, මෙම උපදෙස් වල අන්තර්ගතයේ CCM හට තම වරම් විධිමත්ව දිනා ගැනීම පිලිබඳව දැක්වෙන අතිරේක යහ පාලන ප්‍රතිපත්ති සහ නිර්දේශ ඇතුළත් වේ.

මෙම මාර්ගෝපදේශ වල ඇති ඔබගේ අරමුණු කෙරේ වැදගත් කරුණු වල අනුකූලතාවය වැඩිදියුණු කිරීමට ගෝලීය අරමුදලේ ලේඛකාධිකාරීගේ තාක්ෂණික සහය ලබා ගැනීමට ඔබේ CCMහි සාමාජිකයින් දිරිමත් ගැන්වීමටද ඔබට හැක. එය සිවිල් සංවිධාන, ප්‍රජා-මූලික සංවිධාන සහ අධි අවදානම් කලාප සමග අනුබද්ධව ක්‍රියා කිරීම දිරිමත් කිරීමට ඉවහල් වේ.

කෙසේ වෙතත්, ඔබේ උනන්දුවට පරිභාහිරව, ඔබේ CCM ආයතනය CSO, ප්‍රජාවන් හා අධි අවදානම් කලාප සමග ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, මේ පිලිබඳව ඔබගේ පුද්ගලික උනන්දුව ගෝලීය අරමුදලේ ලේඛකාධිකාරී වෙත දැනුම් දිය හැක.

(Email: ccm@theglobalfund.org; Fax: +41 58 791 1701. )

## මා කෙසේද අපගේ CCM සම්බන්ධ කර ගත යුත්තේ? (How do I contact our CCM?)

ගොලීය අරමුදල විසින් බහුජාතික වැඩසටහන් සඳහා පිහිටුවා ඇති CCM කේන්ද්‍රගත ස්ථාන, නිළධාරීන්, සහ සාමාජිකයින් හා මීට සමාන සම්බන්ධීකාරක යාන්ත්‍රණ පිලිබඳ තොරතුරු ඇතුලත් වාර්තාවක් අන්තර්ජාලයේ ප්‍රකාශයට පත් කර ඇත.

මෙතනින් ආසියා පැසිෆික් කලාපයට අනුබද්ධ CCM ලැයිස්තුව ලබා ගත හැක.

Here’s the list CCMs for the Asia-Pacific region.